# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1913/6 - 2015 මැයි මස 05 වැනි අඟහරුවාදා - 2015.05.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍යවී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

පාඨලී චම්පික රණවක,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2015 අප්‍රේල් මස 30 වැනි දින,

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගඟ අංක 1188 හා ගලත අංක 1185 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පිහිටි, අටබාග වත්තේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා විසින් 2003.06.20 දින පිළියෙල කරන ලද අංක 2360 දරන පිඹුරේ දක්වා ඇති පහත සඳහන් පරිදි මායිම් වූ හෙක්ටයාර 8.00 ක් පමණ වූ මුළු ඉඩම් ප්‍රමාණය :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1737 දරන මහ. පිඹුරෙහි කැබලි අංක 01 සහ අංක 2287 දරන මහ. පිඹුරෙහි කැබලි අංක 05 ; |
| *නැගෙනහිරට* | : | අංක 1737 දරන මහ. පිඹුරෙහි කැබලි අංක 01 ; |
| *දකුණට* | : | මෙම ඉඩමෙහි ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අංක 7480 දරන මහ. පිඹුරෙහි කැබලි අංක 07 සහ අංක 2287 දරන මහ. පිඹුරෙහි කැබලි අංක 05. |

*හිමිකම් කියන අය* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

05 - 449

1A - G 21477 — 56 (2015/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*